# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2264/9 - 2022 ජනවාරි මස 25 වැනි අඟහරුවාදා - 2022.01.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 40/1973 (I)

**(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත**

(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කෙහෙළිය රඹුක්වැල්ල,**
සෞඛ්‍ය අමාත්‍ය.

2022 ජනවාරි මස 25 වන දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත, 1925 අගෝස්තු මස 28 වැනි දින, අංක 7481 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ධාන්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් වන නියෝග හා ඇන්කිලොස්ටොමියාසිස් සම්බන්ධයෙන් වන නියෝග, පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 3 වන නියෝගයේ "පොදු ස්ථානය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"පොදු ස්ථානය" යන්නෙන් අයිතියක් ලෙස හෝ අන්‍යාකාරයෙන්, ගෙවීමක් සිදු කර හෝ ගෙවීමක් සිදු නොකර ආරාධනයක් මත හෝ ආරාධනයක් නොමැතිව ජනතාවට ප්‍රවේශය සහිත, යම් ස්ථානයක් හෝ පොදු ප්‍රවාහනයේ දී භාවිත කරනු ලබන ප්‍රවාහන ක්‍රමයක් අදහස් වේ." ;

1A - PG 5731 — 510 (2022/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එහි 99 වන නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් නියෝග ඇතුලත් කිරීමෙන් :-

''100. විධාන, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ :- (1) සමස්ත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන නිසි බලධරයා විසින්, ජනතාවගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය වේ යැයි ඔහු විසින් සලකනු ලබන අවස්ථාවලදී. රෝග පාලනය සහ රෝග වැළැක්වීමේ ආරක්ෂිත පියවරවලට අදළ යම් නියමයන් සහ කොන්දේසි නිශ්චය කරමින් කලින් කලට යම් විධාන, මාර්ගෝපදේශ, චක්‍රලේඛ, උපදෙස් හෝ නිල පුවත්පත් නිවේදන නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ රෝග පාලනය සහ රෝග වැළැක්වීමේ ආරක්ෂිත පියවරවලට අදළ යම් කාරණයක් ඇතුළත් විය හැකි යම් විධාන, මාර්ගෝපදේශ, චක්‍රලේඛ, උපදෙස් හෝ නිල පුවත්පත් නිවේදන, සමස්ත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන නිසි බලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ''(1) වන උපනියෝගය යටතේ නිකුත් කළ යම් විධාන. මාර්ගෝපදේශ, චක්‍රලේඛ, උපදෙස් හෝ නිල පුවත්පත් නිවේදනවලට අනුකුලවීම සෑම තැනැත්තකුගේම කාර්යය විය යුතුය.

101. (1) **සමස්ත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන නිසි බලධරයා** විසින් නිදහස් කර ඇත්නම් මිස, 2019 කොරෝනා වෛරස් රෝගය (Covid-19) ට එරෙහිව පූර්ණ එන්නත්කරණයක් කර තිබෙන බව ඔප්පු කිරීමට සාධක නොමැතිව තැනැත්තකු යම් පොදු ස්ථානයකට ඇතුළු නොවිය යුතු ය.

මේ නියෝගයේ කාර්යයන් සඳහා "පූර්ණ එන්නත්කරණය" යන්නෙන්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි අදළ එන්නත්කරණයේ අවශ්‍ය මාත්‍රාවන් අදළ තැනැත්තා විසින් ලබාගෙන ඇති බව අදහස් වේ.

(2) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන නිසි බලධරයා විසින්, 2019 කොරෝනා රෝගය (Covid-19) සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ය :

(අ) පූර්ණ එන්නත්කරණයක් සිදු කර ඇති බවට සාධක ;

(ආ) තැනැත්තකු එන්නත්කරණයෙන් නිදහස් කළ හැකි ව්‍යතිරේඛ තත්ව ; සහ

(ඇ) එන්නත්කරණය ලබාගැනීමට යෝග්‍ය වයස් කාණ්ඩ.

(3) (2) වන උපනියෝගය යටතේ කරනු ලබන සෑම නිශ්චය කිරීමක් ම, මාර්ගෝපදේශයක් ලෙස හෝ චක්‍රලේඛයක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය; හෝ නිල පුවත්පත් නිවේදනයක් ලෙස හෝ ප්‍රසිද්ධ දැන්වීමක් ලෙස නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) 2019 කොරෝනා වෛරසය (Covid-19) ට එරෙහි අදළ එන්නත්කරණයෙන් නිදහස් කර ඇති තැනැත්තකුට නිකුත් කළ යුතු ව්‍යතිරේඛ සහතිකය සමස්ත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන නිසි බලධරයා විසින් කලින් කලට නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ මගින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(5) මේ නියෝගයේ විධිවිධාන 2022 අප්‍රේල් මස 30 වැනි දින ක්‍රියාත්මක භාවයට එළඹිය යුතු ය.".

EOG 01 - 0252

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.